# 2. නිෂ්පාදනය සහ ආර්ථික වර්ධනය

වර්ෂ 2002 දී ආර්ථිකය පසුගිය වර්ෂයේ වූ පරිහාණි තත්ත්වයෙන් සහ සෘණ ආර්ථික වර්ධනයෙන් මිදී ප්‍රකෘති තත්ත්වයට පැමිණීමේ මාර්ගයට පිවිස ඇත. ප්‍රතිපත්තිමය නිවැරදිකිරීම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඔස්සේ මැදි කාලයේදී ආර්ථික ක්‍රියාකාරිත්වය වඩා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පුරෝකථනයන් සම්බන්ධයෙන් වර්තමාන සාම ක්‍රියාවලියේ සාර්ථකත්වය තීරණාත්මක ලෙසින් බලපානු ඇත.

2.1 රූප සටහන
කාර්තුමය ආර්ථික වර්ධනය




## 2002 ආර්ථික ක්‍රියාකාරිත්වය

- 2002 වර්ෂයේ ප්‍රථම භාගයේදී දල දේශීය නිෂ්පාදිතය පසුගිය වර්ෂයේ එම කාලයට සාපේක්ෂව සියයට 1.4 කින් වර්ධනය විය. නිරපේක්ෂ අර්ථයෙන් සලකන කල මෙම වෘද්ධි අනුපාතිකය අඩු මට්ටමක පවතින්නේ වී නමුදු, පසුගිය වර්ෂය අග භාගයේ පැවති සෘණ 3.5 ක් වූ අවවර්ධිත තත්ත්වයෙන් ඉහළ ඒමක් එමගින් පෙන්නුම් කරයි. ප්‍රථම භාගයේ වර්ධනය, පසුගිය වර්ෂයේ ප්‍රථම භාගයේ වාර්තා වූ 0.9 ක වර්ධනය සමඟ සසඳන කලද අභිවෘද්ධියක් පෙන්වයි.

- කෘෂිකාර්මික අංශය ප්‍රකෘති තත්ත්වයට පත්වීම බොහෝදුරට දේශීය කෘෂිකාර්මික අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය නිසා සිදුවූවක් විය. ප්‍රවාහනය, ආනයනික වෙළඳාම, දේශීය වෙළඳාම සහ සංනිවේදනය යන අංශයන්ගේ දායකත්වය හේතුවෙන් සේවා අංශයද වැඩි දියුණු විය. කෙසේ වුවත්, ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය මන්දගාමී වීමත්, අඛන්ඩ විදුලිය ඇණහිටුවීම් මැයි මාසය දක්වා පැවතිමත් සහ ඉදිකිරීම් කර්මාන්තය කිසිදු වර්ධනයක් නොපෙන්වීමත් හේතුවෙන් අපනයන හා කාර්මික අංශයන් තවදුරටත් පීඩනයට හසු විය.

- කෘෂිකාර්මික අංශයෙහි වී නිෂ්පාදනය සියයට 10 ක වර්ධනයක් පෙන්විය. බොහෝ එළවළු වර්ගවලද, විශේෂයෙන් අර්තාපල් ඇතුළු තවත් අතුරු ආහාර භෝගවලද, සුළු අපනයන භෝගවලද නිෂ්පාදනය ඉහළයාම දේශීය කෘෂිකාර්මික අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය කෙරෙහි දායක විය. වතු වැවිලි අංශයට අයත් තේ නිෂ්පාදනය ප්‍රබල අන්දමින් වර්ෂයේ දෙවෙනි කාර්තුවේදී ප්‍රකෘති තත්ත්වයට පත් විය. කෙසේ වුවද, 2001 වර්ෂයේ පැවති නියඟයෙහි පසු බලපෑම් හේතුවෙන් පොල් නිෂ්පාදනය තවදුරටත් පහත වැටිණ.

- 2002 වර්ෂයේ ප්‍රථම භාගයේදී සේවා අංශය මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. සේවා අංශයේ වැඩිම වර්ධන

වේගය වාර්තා වූයේ ප්‍රවාහනය, ගබඩා කිරීම් සහ සංනිවේදන අංශයෙනි. තවදුරටත් සියයට 19 කින් වර්ධනය වෙමින් සංනිවේදන අංශය මෙම වර්ධනයට දයකත්වය සැපයිය. උතුරු සහ නැගෙනහිර පළාත්වලට යවන භාණ්ඩ සහ මගී ප්‍රවාහනය ඉහළයාම සේවා අංශයේ නිෂ්පාදනය ඉහළ යාමට ආධාරක විය. වර්තමාන සාම ක්‍රියාවලිය දේශීය වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනයෙහිලා අනගි මෙහෙයක් සිදුකළ අතර, 2001 වර්ෂයේදී පසුබෑමට ලක්වුනු ආනයන වෙළෙඳ කටයුතු ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ ලකුණුද දැකිය හැකි විය. වර්ෂයේ ප්‍රථම භාගයේදී ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් වශයෙන් ගත්කල පහත වැටීම මිල ගණන් පහත වැටීම නිසා සිදුවූවක් වන අතර, ආනයන පරිමාව සැබවින්ම සියයට 5.5 කින් වර්ධනය විය.

- කාර්මික අංශයට ඇතුලත් සියළුම උප අංශ, එනම් නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම්, විදුලිය ගෑස් සහ ජලය, සහ පතල් හා කැණීම් යන අංශ ඍණ වර්ධනයන් වාර්තා කිරීම, පසුගිය වර්ෂයේ පැවැති ආර්ථික පරිහානියෙන් සම්පූර්ණයෙන්ම ප්‍රකෘති තත්ත්වයට පත්වීම පමා කළේය. අපනයනාභිමුඛ කර්මාන්තවල පැවති පසුගාමී තත්ත්වය නිමැවුම් කර්මාන්ත අංශයේ ඍණ වර්ධනයට හේතු වූ අතර, මෙය සමස්ථ ලෝක ඉල්ලුම අඩු මට්ටමක පැවතිම මගින්ද පිළිබිඹු කෙරිණ. ඉදිකිරීම් අංශයේ

2.2 රූප සටහන
2002 වසරේ ප්‍රථම භාගයේදී ද.දේ.නි.ට ආංශික දයකත්වය




පහත වැටීමට හේතු වූයේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වන ආයෝජනයන් අඩු මට්ටමක පවත්වා ගැනීමයි. කෙසේ වුවත්, නිවාස ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි විය.

- ආර්ථිකය වර්ෂයේ දෙවන භාගයෙහිදී වඩා හොඳින් ප්‍රකෘති තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂිතය. සාමාන්‍ය කාලගුණික තත්ත්වයන්, අඛණ්ඩ විදුලි සැපයීම්, ලෝක ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත්වීමත් සමඟ අපනයනාභිමුඛ කර්මාන්තයන් ප්‍රකෘති තත්ත්වයට පත්වීම, ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු, සංචාරක කර්මාන්තය සහ වරාය කටයුතු ඉහළයාම, අභ්‍යන්තර සාමයත් සමඟ වෙළෙඳ සහ ගමනාගමන කටයුතු ඉහළයාම සහ ආයෝජන විශ්වාසදයකත්වය ප්‍රතිෂ්ඨාපනය වීම මෙම පුනර්ජීවනයේ ප්‍රධාන මූලාශ්‍ර වනු ඇත. මේ අනුව, 2002 වර්ෂය සඳහා සියයට 3.0 ක් පමණ වන මධ්‍යස්ථ මට්ටමේ ආර්ථික වර්ධනයක් පුරෝකථනය කර ඇත.

- නියත වශයෙන්ම, මෙම පුරෝකථනයන්ට පාදක වන උපකල්පනයන් වෙනස්වීම්වලට භාජනය විය හැකිය. ශ්‍රී ලාංකික කාර්මික අපනයනයන් සඳහා විශාලතම වෙළෙඳපොල වන ඇමරිකානු ආර්ථිකය සම්බන්ධයෙන් වන ඉතා මෑත කාලීන පුරෝකථනයන් පෙන්වා දෙන්නේ ඇමරිකානු ආර්ථිකය පිළිබඳ තත්ත්වය පෙරදී අපේක්ෂා කළ තත්ත්වයට වඩා අයහපත් බවයි. මෙය නිසැකයෙන්ම දෙවන භාගයේදී කාර්මික අපනයන ප්‍රකෘති තත්ත්වයට පත්වීම පිළිබඳ අපේක්ෂණයන්ට අනතුරුදයක අන්දමින් බලපානු ඇත. දේශපාලන අර්බුදකාරී තත්ත්වය ද කිසියම් අස්ථාවරභාවයක් මතුකර ඇති අතර. එය නොනැවති පැවතියහොත් ආර්ථිකය කෙරෙහි ඍණාත්මක බලපෑම් ඇති කෙරෙනු ඇත. ධනාත්මක අංශයන් සලකනකල, වර්තමාන සටන් විරාමය අඛණ්ඩව පැවතුනහොත් සහ සාම ක්‍රියාවලිය ශක්තිමත් ලෙසින් ඉදිරියට යන්නේ නම් ආයෝජන විශ්වාසදයකත්වය ඉහළ ගොස් ආයෝජන ක්‍රියාකාරකම් සහ ආර්ථිකයේ සමස්ථ නිමැවුම ඉහළ යනු ඇත.

2003 සඳහා ඉදිරි දැක්ම

- වර්ෂ 2003 දී ආර්ථිකය සියයට 5.5 පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. 2003 වර්ෂයේදී විශේෂයෙන් එහි අග භාගයේදී, ලෝක ආර්ථික ක්‍රියාකාරිත්වය වඩා යහපත් වේයැයි අපේක්ෂා කරන අතර, මෙය ධනාත්මක වශයෙන් දේශීය ආර්ථිකයෙහි පිළිබිඹු වනු ඇත. උතුරු-නැගෙනහිර ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කටයුතු සඳහා අපේක්ෂිත විදේශාධාර මගින්ද නව ආර්ථික ක්‍රියාකාරකම් උත්පාදනය කෙරෙනු ඇති අතර, එය සමස්ථ ආර්ථික වර්ධනය ඉහළ දැමීමට හේතු වනු ඇත.

- කාර්මික හා සේවා අංශ 2003 වර්ෂයේ ප්‍රධාන වර්ධනාත්මක අංශ වනු ඇත. අපනයාභිමුඛ කර්මාන්ත ලෝක ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමත් සමඟ ඊට සමාන්තරව ඉහළ යනු ඇත. යුද්ධයෙන් විනාශ වුනු උතුරු ප්‍රදේශයේ පුනරුත්ථාපන කටයුතු ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය ගාමකත්වය සපයනු ඇත. මීට අමතරව. මේ දක්වා ක්‍රියාවට නොනැගුණු අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සඳහා වන ආයෝජනයන් ද 2003 වර්ෂයේදී ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්‍ෂිතය. ආර්ථිකයේ ප්‍රාථමික හා ද්විතියික අංශයේ වර්ධනය ප්‍රවාහනය, සංනිවේදනය, වෙළෙඳම මූල්‍ය සේවා හා විනෝද සේවා වැනි සේවා අංශයේ ක්‍රියාකාරකම් සඳහා ඉල්ලුමක් ජනිත කරනු ඇත.

- 2003 වර්ෂය සඳහා අපේක්ෂිත වර්ධන ඉලක්ක සපුරා ගැනීම ලෝක ආර්ථික ක්‍රියාකාරිත්වය සහ වර්තමාන සාම ක්‍රියාවලියේ සාර්ථකත්වය මත විශාල වශයෙන් රඳා පවතී. මෙම ඉලක්ක සපුරා ගැනීමේදී තවදුරටත් රටෙහි දේශපාලන ස්ථාවර භාවයද අත්‍යාවශ්‍ය වනු ඇත.